# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது/<br>My No DSD/HO/06/EP/10ගෘහ ආශ්‍රිත කර්මාන්ත | ඔබේ අංකය<br>உமது இல<br>Your No ............................................ | දිනය<br>திகதி<br>Date 2021.07.27 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ,

සියළුම සමෘද්ධි කළමණාකරු,

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2021**

**රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය**

මෙම වසරෙහි මුල් මාස කිහිපය තුළ රටෙහි පැවති කොවිඩ් 19 වෛරස් රෝග තත්ත්වය හේතුවෙන් රජය විසින් විටින් විට රට අගුළුලෑම නිසා සහ විටින් විට පැනවූ සංචරණ සීමා හේතුවෙන් ව්‍යවසාය සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සංවර්ධන වැඩසටහන් තාවකාලිකව කල් දැමීමට සිදු විය. වර්තමානය වන විට රට බොහෝ දුරට යහපත් වී ඇති බැවින් නැවතත් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ආරම්භ කොට පවත්වා ගෙනයාම පිළිබඳව ව්‍යවසාය සංවර්ධන අංශයේ විශේෂ අවධානය යොමු වී ඇත.

02. මෙහිදී රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සම්බන්ධව DSD/HO/04 – 06/J – M/Circular/2021 හා 2021.03.25 දිනැති ජීවනෝපාය සංවර්ධන හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන 2021 චක්‍රලේඛයෙහි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - 2021 හි අංක 08 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

03. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන DSD/HO/6/EP/10/Industry හා 2021.06.29 දිනැති ලිපිය මගින් මේ වන විටත් ඔබ දිස්ත්‍රික්කය වෙත නිදහස් කර ඇත. එක් ව්‍යවසායකයෙක් වෙනුවෙන් භාණ්ඩ ලබා දීම සඳහා ලබා දිය හැකි උපරිම මුදල රු. 5,000/= ක් වන අතර එම දායකත්වය ප්‍රමාණවත් නොවන්නේ නම් එය රු. 10,000/= දක්වා වැඩි කළ හැකිය. එසේ අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

04. ප්‍රතිපාදන නියමිත පරිදි භාවිතයට ගනිමින් සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ගෘහාශ්‍රිත කර්මාන්තවල යෙදෙන සමෘද්ධි ව්‍යවසායිකාවන් හා ව්‍යවසායකයින් සඳහා තම නිෂ්පාදනවල තත්ත්වය, ගුණාත්මකභාවය, ප්‍රමිතිය වැඩි දියුණු කර ගැනීමට සහ අගය එකතු කර ගැනීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලබා දිය හැකිය. එක් ව්‍යවසායකයෙක් සඳහා එක් අවශ්‍යතාවයක් වෙනුවෙන් පමණක් නැවත අය නොකිරීමේ පදනම මත ප්‍රතිපාදන ලබා දිය හැකි අතර එම අයගේ දායකත්වය සමස්ථ ව්‍යාපෘති ඇස්තමේන්තුවෙන් අවම වශයෙන් 40%ක් වත් විය යුතුය.

05. භාණ්ඩ ලබා දීමේදී භාණ්ඩාගාර චක්‍රලේඛ, මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රමවේදයන් නිසි පරිදි අනුගමනය කල යුතු අතර ව්‍යවසායකයින්ගේ ජීවන තත්වය, ආර්ථිකය, සෞඛ්‍ය මට්ටම ආදී අංශයන් ඉහල නැංවීමට දායක වන ආකාරයෙන් කටයුතු සිදු කිරීමට වග බලා ගත යුතුය. මීට අදාල වියදම් වාර්තාව සහ ප්‍රගති වාර්තාව අප වෙත යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

06. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී කොවිඩ් 19 වෛරස් රෝගයෙන් ආරක්ෂාවීම හා අනෙකුත් කාරණා සම්බන්ධව රජය, ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ හා දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් පනවනු ලබන නීතිරීති, උපදෙස්, මගපෙන්වීම්, රෙගුලාසි හා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම නිසි පරිදි අනුගමනය කිරීම අනිවාර්ය වේ.

මෙම වැඩසටහන සම්බන්ධව ඔබගේ පෞද්ගලික අවධානය යොමු වනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වන අතර මේ පිලිබඳව ඔබෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකමි.

එම්. ජී. එස්. එස්. කිත්සිරි
අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) වැ. ආ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.